**ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
**මහලේකම් කාර්යාලය, කොළඹ 01**

## සමාන්‍ය ප්‍රසම්පාදන දැන්වීම (GPN)

රජයේ සංවර්ධන වැඩපිළිවෙල කඩිනම්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවන් හා ක්ෂේත්‍ර කටයුතු සඳහා වන වාහන අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතාවය සපුරාලීම සඳහා රාජ්‍ය බැංකුවක් මගින් ලබාදෙන මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ දේශීය අරමුදල් මගින් වාහන මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, පහත දක්වා ඇති වාහන සහ යන්ත්‍රෝපකරණ, මිල දී ගැනීමට/ රාජ්‍ය බැංකු වෙතින් වසර 05ක මූල්‍ය කල්බදු පදනම යටතේ මිලදී ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

| වාහන වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ට්‍රැක්ටර් | 175 |
| ගලි බවුසර් | 100 |
| බැකෝ යන්ත්‍ර | 100 |
| ත්‍රී රෝද රථ | 90 |
| ටිපර් රථ | 160 |
| මෝටර් ග්‍රේඩර් | 75 |

මෙම ප්‍රසම්පාදනය මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කිරීමට තීරණය කර ඇති අතර ඊට අදාළ ප්‍රසම්පාදන ලියවිලි 2025 ඔක්තෝබර් මස නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලිය මගින්, රජයේ කටයුතු කාර්යක්ෂමව, විනිවිද භාවයෙන් යුතුව හා කඩිනමින් සිදු කිරීම අරමුණු කරයි.

ප්‍රසම්පාදනයන් පිළිබඳව උනන්දුවන පාර්ශවයන්ට හා ලංසුකරුවන්ට අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා පහත දැක්වෙන ලිපිනයෙන් විමසීම් කළ හැකිය.


ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01